# අනෙක් පුවත්

සුනන්ද දේශප්‍රිය

## තීබන්ගේ මරණය

තිබන් දහසය හැවිරිදි ය. කාරතිව් හි කෙසර් පාරේ සුනාමි සරනාගත කඳවුරෙහි ජීවත් වූ තීබන් මාර්තු 03වනදා රැයෙහි වෙඩි තබා මරා දැමුණි. 2004 සුනාමියෙන් පසු TVE ආයතනය සුනාමි රටවල් හතරක දරුවන් අටදෙනෙකු ගේ ජීවිතය වසරක් පුරා විපරම් කරමින් තැනූ ***සුනාමියේ දරුවෝ*** සිනමා පටයේ සිටි දරුවන් අට දෙනාගෙන් එක් අයෙක් වූයේ තීබන් ය.

අසම්පූර්ණ ප්‍රවෘත්ති වාර්තා අනුව කේසර් පාරේ අනාත කඳවුරට කඩා වැදුණු හතරදෙනෙකුගෙන් යුත් සන්නද්ධ කණ්ඩායමක් තීබන්ට වෙඩි තබා මරා දමන ලදී. කදවුරු වැසියන් විසින් ඉන් එක් අයෙක් අල්ලා පොලීසියට බාර දුන්නේ යැයි කියනු ලැබේ.

මේ අකටයුතු ඝාතනයට හේතුව කුමක්දැයි හෝ වගකිව යුතු කව්රුන්දැයි කියා හෝ තොරතුරක් නැත. තීබන් ගේ ඝාතකයින් කවදා හෝ යුක්තිය හමුවට පැමිණවෙනු ඇතැයි සිතීම දුෂ්කර ය.

ඔහුගේ සිහින සුනාමිය විසින් බිඳ දමන විට තීබන් ගණිතයට සිනමාවට සහ ක්‍රිකට් ක්‍රිඩාවට ඇලුම් කළ 14 හැවැරිදි ක්‍රියාශීලී දක්ෂ පාසැල් දරුවකු විය. සුනාමිය ඔහුගේ මව සහ බාල සොයුරා බිලි ගත්තේ ය. පියාගේ ධීවර කර්මාන්තය සුන්බුන් කලේ ය. මධ්‍යම පන්තික පවුල එක් සැනින් අනාථයින් බවට පත්ව අම්පාර දිසාවෙහි කාරතිව් හි තාවකාලික ලැගුම්හලකට වැටුණි.

සුනාමියෙන් විපතට පත් සාමාන්‍ය පවුලක් සොයමින් සිටි ඔඩ්‍ය කන්ඩායමට තීබන් හමුවූයේ එසේ ය. වසරක් පුරා ඔහුගේ ජීවිතය දර්ශන ගත කිරීමට ඔවුනට අවශ්‍ය විය. මුනුපිරු මිනිපිරියන් තිදෙනෙකු රැකබලා ගනිමින් සිටි අච්චි අම්මා ද තීබන්ගේ පියා ද ඊට කැමැත්ත දුන්හ. මසක් පාසා වීඩියෝ කණ්ඩායමක් එහි ගොස් තීබන් ගේ ජීවිතය වෙනස් වන සැටි රූ ගත කලෝ ය.

සුනාමියෙන් පසු තීබන් පාසැල් ගමන නවත්වා ටැක්ටර් ගරාජයක අත් උදව්කරුවකු සේ වැඩ පටන් ගත්තේ ය. කායික ශ්‍රමය මේ 14 හැවිරිදි දරුවාට එතරම් ලෙහෙසි නොවූ නමුත් ඔහු මාස ගණනාවක්ම එහි කටයුතු කලේ ය. වැඩිමහල් තරුණයින් ඔහුට හිරිහැර කිරීමට පටන් ගත් කළ ගරාජයෙන් ඉවත්ව මුහුදු වෙරලේ සුනාමි සුන්බුන් ඉවත්කිරීමේ වැඩට බැඳුණෝ ය. එතැන පටන් මේසන් අත්වැඩ සහ ගොයම් කැපිම වැනි කුලී වැඩෙහි යෙදුණි.

2005 දී චිත්‍රපටයේ සාකච්ජාවකට සහභාගිවෙමන් ඔහු මෙසේ කීවේ ය: *අනෙත් ළමයි ඉගෙන ගනිද්දී මේ වයසෙදිම රස්සාවක් කරන එක මට ආඩම්බරයක්. වසය මදි නිසා බොරු කියන්න වුණා වසය 19යි කියලා.*

එහෙත් සමහර දිනෙක තීබන්ට වැඩ සොයා ගැනීමට බැරි විය. සුනාමියෙන් පසු ලොව පුරා ජනයා සහ ආණ්ඩු පරිත්‍යාග කළ බිලියන ගණන් මුදල් තීබන් ගේ පවුලේ තත්ත්වය වැඩි දියුනු කිරීමට ආවේ නැත. 2005 අගෝස්තුවේ දී ඔහු මෙසේ කීය: *සමහර සංවිධාන බෝට්ටු දෙන්න පොරොන්දු වුනා. සමහරුන්ට ලැබුණාත් එකක.*

නමුත් තීබන් ගෙ පවුලට එවැනි සහායක් ලැබුනේ නැත. ඔහුගේ පියා මානසික පීඩාවට පත්විය. බීමට ද අබ්බැහි විය. සිය පවුලේ දරුවන් ජීවන අරගලයේ ලා වැටිවැටී නැගිටින සැටි ආච්චි අම්මා අසරණව සහ සෝබරව බලා සිටියා ය. එහෙත් ඇයට පවුල එකට තබා ගැනීමට බැරි විය. පියා යළි විවාහ වී 2006 ආරම්භයේ දී වෙනතක ගියාය. තීබන්ගේ බාල සහෝදරයින් දෙදෙනා අම්පාර අසළ බාලක නිවාසයක නේවාසික කෙරුණි.

සුනාමියෙන් මාස 26කට පසු සිය මරණය වූ අවස්තාවේ දී තිබන් සහ ආච්චී එතෙකුදුත් ජීවත් වෙමින් සිටියේ සලාක ආහාරයෙන් යැපෙමින් තාවකාලික කදවුරක ය. තරුණ වියට එළඹෙමින් සිටි තීබන්ට මුහුණ දීමට සිදු වූ ගැහැට පමණ ඉක්මවන තරම් විය. මුලින් මතකයේ ඇති මහම විනාශයකට හසුව ජීවිතය සහමුලින් ම බිඳ වැටුනි. අනතුරුව මාස ගනනාවක් තුළදී ඔවුන් ද ඇතුලුව යුද ගැටුමට මැදි වූ දස දහස් ගණන් ජනයා ද්විත්ව ව්‍යසනයකට ඇද දමමින් නැගෙනහිර ශ්‍රී ලංකාවේ ප්‍රචන්ඩත්වය යලි හිස එසැවීය.

තිබන් ගේ ජීවිතය ද ඇතුළත් වූ ***සුනාමියේ දරුවෝ : ගමන නොනැවතේ*** යන සිනමා පටයේ අවසන් වචන මෙසේ විය. *පවුල් අටක් සමග කෙරුණු අපගේ ගමන මෙතැනින් නවතී. ඉදිරි මාසයන්හි දී ඔවුන් ද ඔවුන් වැනි දහස් ගනනාවක් පවුල් ද සිය ජීවිත ගොඩ නගා ගැනීමේ නොනැවත ගමන් කරනවා ඇත.*

***සුනාමියේ දරුවෝ*** හැදූ සියල්ලන්ටම තිබන්ගේ මරණය පවුලේ මරණයක් හා සමාන විය. ඒ විසින් හඬ ගා කීයේ ස්වභාව ධර්මයාගේ කෝපාග්නියට වඩා මිනිසා කෙරෙහි වන මිනිසාගේ අමිනිස්කම බියකරු බව ය.

**TEV** ය මගින් ප්‍රසිද්ධ කළ සටහනක් ඇසුරිණි.

පසු සටහන:

**තිබන්ගේ මරණයේ විස්තර සෙවීමට අදාළ පොලිස් ස්ථාන තුනකට සහ නිලධාරීන් හය හත් දෙනෙතුට කතා කළෙමු. ඔව්, තීබන් කියලා වසය 17 මේසන් කෙනෙක් වෙඩි තියල මරල දාලා තිබුණා. හේතුව සොයා ගන්න බැරි වුණා. බලධාරීන්ට තීබන් ද යුද්ධයට හසුව නමක් ලිපිනයක් නැතිව මිය ගිය එක අංක ගණිතමය සංඛ්‍යාවක් පමණි.**

## යුද්ධය සහ දෙමළ සමාජය

එල්ටීටීඊ ය සමඟ දීර්ඝ කාලීන දේශපාලන ගැටුමක යෙදී සිටින ඒ නිසාම රහසිගතව ජීවත්වීමට බල කෙරී ඇති මානව හිමිකම් සඳහා සරසවි ආචාර්යවරු (යාපනය) අලුත්ම වාර්තාවෙන් උපුටා ගත් කොටස් කිහිපයක් මෙසේ ය:

*මෙම වාර්තාවෙහි අප විස්තර කරන ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ වුවත් උතුරු නැගෙනහිර දෙමළ ජනයා එල්ටීටීඊයට එරෙහිව අරගල කරති. නමුත් නිරන්තරයෙන්ම ආණ්ඩුව කරගෙන යන බෝම්බ දැමීම්, ෂෙල් ප්‍රහාර, පැහැර ගැනීම් සහ මරා දැමීම් හමුයේ එවැනි කවර හෝ විරුද්ධත්වය දැක්වීමක් සඳහා අධිශ්ඨානයක් ඉතිරිවනු ඇත්දැයි සැක සහිත ය. එලෙම එල්ටීටීඊ සැකකරුවන් යැයි රජයේ ඝාතක කණ්ඩායම් විසින් මෑත කාලයේ දී මරා දමන ලද පිරිස් අතර මෙම වාර්තාවන්ට කරුනු සැපයූ පුද්ගලයින් ගණනාවක් ද සිටිති.*

*මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තර්කාණුකූලව කල්පනා කර සිය ස්ථාවරය වෙනස් ගැනීමට හෝ අනෙක් අදහස් පිළිගැනීමට හෝ හැකියාවක් පෙන්වා නැත. සිදුවීම් පිළිබඳව තර්ජනාත්මක සහ ඇදහිය නොහැකි හේතු දැක්වීම් ඉදිරිපත් කරන අතර මාධ්‍යය, සිවිල් සමාජ ක්‍රියාකාරීන්, සහ එල්ටීටීඊ පාලන පෙදෙස්හි ජනයාට හදිසි සහනාධාර සපයන රජයේ නොවන සංවිධානයන්ට පවා එරෙහිව දරුණු චෝදනා, තර්ජන සහ ප්‍රචණ්ඩත්වයන් මුදා හැර ඇත.*

*මෙම තත්තතවයේ විපාකයක් ලෙස අද ශ්‍රී ලංකාව පෙන්වන්නේ අරාජික පින්තූරයකි. අධිකරණය, පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව මෙන්ම ශිෂ්ටාචාරයේ පැවැත්ම සහතික කරන අනෙක් සියළු ආයතන ද දුබල කරනු ලැබ ඇත. බලය පාවිච්චි කරනු ලබන්නේ අතලොස්සක් වන්ඩින් විසිනි. ජනමාධ්‍ය ආණ්ඩුවේ ජනප්‍රියවාදී උමතුව ප්‍රයෝජනයට ගනිමින් අනෙක් සෑම විදේශිකයකුම එල්ටීටීඊ හිතවාදියකු ලෙස හංවඩු ගසයි. ඔවුන් තේරුම් නොගන්නා දෙය නම් දෙමළුන්ට එරෙහිව ප්‍රචන්ඩත්වය සහ විදේශික භීතිය පැතිරවීම මගින් සහ එල්ටීටීඊ ය අරභයා ගැඹුරු සහ දැනුවත් සංවාදයක් වැළැක්වීම මගින් රජය කරනු ලබන්නේ එවැනි හිතවාදී තත්ත්වයක් නිර්මාණය කිරිම බව යි. 1980 ගනන් වලදී මෙන් වැඩි පමාවකින් තොරව ඛේදජනක විපාක සිංහලයින්ටද අත් විදීමට සිදුවනවා ඇත.*

2007.03.18